ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II පත්‍රය | කාලය පැය 02 යි |
|---|---|---|

**සැළකිය යුතුයි: -**
පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද , II කොටසෙන් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පමණක් පිලිතුරු සපයන්න.

---

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් I සිට X දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අ.පො.ස (උ/පෙළ) අවසන් වීමත් සමඟ දහම් පියසෝම නව විලාසිතාවන්ගෙන් යුත් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් "සඳරු" ඩ්‍රෙස් පොයින්ට් නමින් ආරම්භ කළේය. දහම්ගේ පියා ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක හිමිකරුවෙකු වන අතර නිතර එම ව්‍යාපාරික කටයුතු වලට සහභාගි වීම දහම්ගේ ව්‍යාපාරික දැනුම වැඩි කිරීමට හේතු විය.

2016.01.01 දින ව්‍යාපාරය ආරම්භ කිරීමට රු.200000.00ක මුදලක් යෙදවූ අතර රු.150000.00 ක බැංකු ණයක්ද ලබා ගත්තේය.

2016.01.02 රු.125000.00කට මහන මැෂින් 03ක්ද, රු.20000.00 ක රෙදිද, මිළදී ගත් අතර පුහුණු සේවකයන් දෙදෙනෙක්ද බඳවා ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 2016.01.03 | ලී බඩු ණයට ගැණුම් | රු. 7000.00 යි |
| 2016.01.05 | රෙදි ණයට ගැණුම් | රු.12000.00 යි |
| 2016.01.09 | නිමි ඇඳුම් විකුණුම් | රු.45000.00 යි |
| 2016.01.12 | විදුලි බිල ගෙවීම | රු. 3000.00 යි |
| 2016.01.18 | ජල බිල්පත් ගෙවීම | රු. 1000.00 යි |

දහම් ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කරන අතර ව්‍යාපාරය සඳහා නෛතික පුද්ගල භාවයක්ද ලබා ගැනීමට බලාපොරොත්තු වෙයි.

පහත සඳහන් ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

I. පහත සඳහන් ව්‍යාපාරය නිෂ්පාදිතය අනුව වර්ග කිරීමේදී කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේද?
II. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? හේතු දක්වන්න.
III. මෙම ව්‍යාපාරයේ ශක්තීන් 02 ක් ලියන්න.
IV. නෛතික පුද්ගල භාවයක් ලබා ගැනීමට මෙම ව්‍යාපාරය, ව්‍යාපාර සංවිධානයක් බවට පත් කල යුතුද?
V. මෙම ව්‍යාපාරයේ වත්කම් වැඩිවන හා වගකීම් වැඩිවන ගනුදෙනුවක් ලියන්න.
VI. මෙම සිද්ධියට අදාළ මුලික පොත් 02ක් නම් කරන්න.
VII. මෙම ව්‍යාපාරයේ ජනවාරි මාසයට අදාල මුදල් ශේෂය කොපමණද?
VIII 2016.01.01 දිනට අදාල ගිණුම්කරණ සමීකරණය වටිනාකම සහිතව දක්වන්න.
IX. මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණද?
X. මෙහි ඇතුලත් ප්‍රාග්ධන වියදමක් සහිත ගනුදෙනුවක් ලියන්න.

(ලකුණු - 2x10)

www.edudept.up.gov.lk

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. භාග්‍යා මධුභාෂිණී රු.10000.00 ක් යොදා මල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එය විහාරස්ථානයක් අසල පිහිටීමත්, ඊට යාබදව මල් ශාලාවක් පැවතීමත් ඇයට ශක්තියක් විය. ව්‍යාපාරය පුළුල් කිරීමට භාග්‍යා අපේක්ෂා කරන අතර හවුල් කරුවෙකු ලෙස ඇයගේ යෙහෙළියක් වන ශානිකා මධුවන්ති බඳවා ගැනීමට අදහස් කරයි.

I. අ) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත් වේද?
ආ). එම ව්‍යාපාර සංවිධානයේ දැකිය හැකි අවාසි 02ක් ලියන්න. (ලකුණු - 02)

II. අ). මෙම සිද්ධියේ දැක්වෙන නිෂ්පාදන සාධක 02ක් නම් කරන්න.
ආ). මෙම ව්‍යාපාරයේ වගකීම හා පැවැත්ම පිළිබඳ ඔබට කුමක් කිව හැකිද? (ලකුණු - 02)

III. අ). ශානිකා මෙම ව්‍යාපාරයට එක් වූ විට එය කුමන ව්‍යාපාර සංවිධානයක් බවට පත් වේද?
ආ). එවැනි ව්‍යාපාර සංවිධානයක ඔබ දකින වාසි 02ක් ලියන්න. (ලකුණු - 02)

IV. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
අ). ආරක්ෂාව,නිවාස,පොත්පත් හා රෝහල් මූලික මිනිස් අවශ්‍යතා වේ.
ආ). තනි පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
ඉ). වෙළඳාමේදී භාණ්ඩයක හිමිකම එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට මාරු වීමක් සිදු වේ.
ඊ). නැවත විකිණීමේ පරමාර්ථයෙන් නිෂ්පාදිත මිළට ගැනීම තොග වෙළඳාමයි. (ලකුණු - 02)

03. I. අ). චෙක්පතක් සම්බන්ධයෙන් විශේෂ රේඛනය යන්න හඳුන්වන්න.
ආ). සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක් හා ස්ථාවර තැන්පතු ගිණුමක් අතර පවතින වෙනස් කම් 02ක් ලියන්න. (ලකුණු - 02)

II. තීක්ෂණ දුලාර ණයපත් පිලිබඳව මහජනතාව තුළ ඇති අවබෝධය හා ඒ පිලිබඳව දක්වන කැමැත්ත ආදී තොරතුරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකරයි. එහිදී ඔහු පහත ප්‍රශ්න වලට පිලිතුරු ඔබෙන් අපේක්ෂා කරයි.
අ). ණයපත් භාවිතයෙන් ව්‍යාපාරිකයාට අත් වන වාසියක් ලියන්න.
ආ). ණයපතකට සාපේෂව හරපතක ඇති වෙනස්කමක් ලියන්න. (ලකුණු - 02)

III. විද්‍යුත් මුදල් භාවිතයේ වාසි අවාසි 01 බැගින් ලියන්න. (ලකුණු - 02)

IV. රක්ෂණ මූලධර්ම 02ක් නම් කර ජීවිත රක්ෂණයේදී අදාල නොවන රක්ෂණ මූලධර්මය නම් කරන්න. (ලකුණු - 02)

04. ටෂින් භානුක විසින් අළුතෙන් ආරම්භ කරන ලද ජංගම දුරකතන අලෙවිසැළ පිලිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට අදහස් කරයි.

I. අ). ඒ සඳහා යෝග්‍ය සන්නිවේදන මාධ්‍ය 02ක් ලියන්න.
ආ). සුදුසු සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේදී ඔහු විසින් සලකා බැලිය යුතු කරුණු 02ක් ලියන්න. (ලකුණු - 02)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
අ). අනතුරකදී සිදුවන විනාශය වැඩිවීම ගුවන් මාර්ග ප්‍රවාහනයේ අවාසියකි.
ආ). ව්‍යාපාරයේ මානව සම්පත් නිසි පරිදි හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.
ඇ). ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම සංවිධාන කරුණුය.
ඉ). නිෂ්පාදිතයට මිලක් ලකුණු කිරීම අලෙවිකරණයට අයත් කාර්යයකි. (ලකුණු - 02)

III. මංජු ශ්‍රී දඹගොල්ල යෝගට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර ඇත. ඔහුගේ නිෂ්පාදිත සඳහා අලෙවි ප්‍රවර්ධන ක්‍රම යොදා ගැනීමට අදහස් කරයි.
අ). එම නිෂ්පාදිතය සඳහා සුදුසු අලෙවි ප්‍රවර්ධන ක්‍රම 02ක් යෝජනා කරන්න.
ආ). මෙම නිෂ්පාදිතයට මිලක් නියම කිරීමේදී ඔහු විසින් සළකා බැලිය යුතු කරුණු 02ක් ලියන්න. (ලකුණු - 02)

IV. අලෙවිකරණ මිශ්‍රණයට අයත් විචල්‍යයන් 04 ක් ලියන්න. (ලකුණු - 02)

www.edudept.up.gov.lk

**<u>II කොටස - ගිණුම්කරණය</u>**

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05. I. අ) ජංගම වත්කම් කෙටියෙන් පැහැදිලි කරන්න.
ආ). ජංගම නොවන වත්කම් වලට නිදසුන් 02ක් ලියන්න. (ලකුණු - 02)

II. ජිනාත් ප්‍රභාශගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ පළමු දෙසතිය තුල සිදු වු ගනුදෙනු පහත දැක්වේ.

2017.01.01 - ප්‍රාග්ධනය ලෙස රු.100000.00ක් ව්‍යාපාරයට යෙදවීම.
2017.01.05 - රු.5000.00ක බඩු තොගයක් පමුදු රුක්මාල්ගෙන් ණයට ගැනීම.
2017.01.10 - රු.1000.00ක් දුරකතන බිල ගෙවීම.
2017.01.12 - රු.8000.00කට ගත් බඩු තොගයක් රු.10000.00කට විකිණීම.
2017.01.15 - ජිනාත් පෞද්ගලික ප්‍රයෝජනයට රු.3000.00ක් ලබා ගැනීම.

ඉහත ගනුදෙනු පහත සඳහන් ආකෘතිය භාවිතා කරමින් ගිණුම්කරණ සමීකරණයෙහි දක්වන්න.

| ගනුදෙනුව | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 01 | + 100000 (මුදල්) | + 100000 (ප්‍රාග්ධනය) | |

(ලකුණු - 02)

III. අ) පහත දක්වා ඇති වගුවේ හිස්තැන් පුරවන්න.

| මූලික පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| I.................................................... | ලදුපත |
| II.................................................... | තැන්පත් කිරීමේ කුවිතාන්සි |
| III.පොදු ජ'නලය | ........................................................ |
| IV.ගැනුම් ජ'නලය | ........................................................ |

(ලකුණු - 02)

ආ). මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජන 02ක් ලියන්න. (ලකුණු - 02)

IV. යෝග්‍යා මධුමාධවීගේ ව්‍යාපාරයේ 2017 මාර්තු මාසයට අදාළ ගනුදෙනු කිපයක් පහත දැක්වේ.

2017.03.01 - දිනට බැංකු ශේෂය රු.74000.00
2017.03.03 - ණය හිමියෙකු වු යසිඳුට චෙක්පතකින් ගෙව්වා රු.8000.00යි. ලැබූ වට්ටම 800.00 යි.
2017.03.06 - ණය ගැතියෙකු වු පුබුදු චතුරංගගෙන් චෙක්පතක් ලැබුනා රු.6000.00යි. එය එවෙලේම බැංකුවේ තැන්පත් කලා. දුන් වට්ටම රු.300.00යි.
2017.03.10 - ගෙවල් කුලී ගෙව්වා චෙක්පතකින් රු.4000.00 යි.
2017.03.13 - ණය හිමියෙකු වු නවෝද්‍යාට ගෙව්වා රු.5000.00යි. ලැබූ වට්ටම රු.500.00යි.

අවශ්‍ය වන්නේ,

I. ඉහත ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කර තුලනය කිරීම. (ලකුණු - 03)
II දුන් වට්ටම් හා ලැබූ වට්ටම් ගිණුම සකස් කිරීම. (ලකුණු - 01)

06. I. අ) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි 02ක් ලියන්න.
ආ). ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර වල සකස් කරන ලැබීම් හා ගෙවීම් ගිණුමත්, ආදායම් ප්‍රකාශණයත් අතර වෙනස්කම් 01බැගින් ලියන්න. (ලකුණු - 02)

II. දුෂාන් අරවිඳු ව්‍යාපාරයේ 2017 පෙබරවාරි මාසයේ බැංකු ගිණුමේ ශේෂය රු.34300.00ක් විය. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් වු අතර එයට හේතු පහත දැක්වේ.

- නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් රු.4500.00යි.
- බැංකුව වෙත සෘජුවම ලැබුණු ණයගැති ප්‍රේෂණ රු.6000.00යි.
- බැංකුව අයකරගෙන තිබූ බැංකු ගාස්තු රු.1000.00යි.
- තැන්පත් කල නමුත් නිෂ්කාශනය නොවු චෙක්පත් රු.3900.00යි.

www.edudept.up.gov.lk

අවශ්‍ය වන්නේ,

අ) බැංකු ගිණුම සංශෝධනය කිරීම.

ආ) 2017.02.28 දිනට බැංකු සැසඳුම් විස්තරය පිලියෙල කිරීම. (ලකුණු - 04)

III. දිනිතිගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම සමාන නොවිය. එහි වෙනස වූ රු.10000.00ක් අවිනිශ්චිත ගිණුමේ හරට සටහන් කරන ලදි. පසුව පහත වැරදි හෙළිදරව් විය.

- විකුණුම් ජ'නලයේ එකතුව රු.36000.00ක් විකුණුම් ගිණුමේ රු.45000.00ක් ලෙස සටහන් වීම.
- ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා වැය වූ රු.20000.00ක මුදල ගොඩනැගිලි ගිණුමේ සටහන් කර තැබීම.
- ගෙවූ රක්ෂණ ගාස්තු රු.1000.00ක් රක්ෂණ ගාස්තු ගිණුමේ සටහන් කර නැත.
- අවශ්‍ය වන්නේ,

වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් (ලකුණු - 03)

IV. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද? අසත්‍යද? යන්න දක්වන්න.

අ). මුලධර්ම දෝෂ තුලින් ශේෂ පිරික්සුමේ වෙනසක් ඇති කරයි.

ආ). ශේෂ පිරික්සුම සමාන වුවද ගිණුම්කරණ දෝෂ තිබිය හැකිය.

ඉ). ආදායම් ප්‍රකාශය සකස් කිරීමේදී මුදල් ලැබීම් හා ගෙවීම් සියල්ල සටහන් කරයි. (ලකුණු - 03)

07. "සෙත්විමණි" ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ 2016 දෙසැම්බර් මාසයේ පුටු නිෂ්පාදනය සඳහා අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| දැව සඳහා වියදම් | රු.90000.00 |
| වඩු කාර්මික වැටුප් | රු.30000.00 |
| ඍජු වෙනත් වියදම් | රු.10000.00 |
| ඇණ,පොලිෂ්,බුරුසු,සඳහා | රු. 7000.00 |
| කම්හල් කුලී | රු. 7000.00 |
| සුපරීක්ෂණ වේතන | රු.10000.00 |
| යන්ත්‍ර ක්ෂය | රු. 2500.00 |
| විදුලි ගාස්තු | රු. 5000.00 |

I. ප්‍රාථමික පිරිවැය ගණනය කරන්න. (ලකුණු - 02)

II. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කරන්න. (ලකුණු - 02)

III. දේවින් ඒකනායකගේ වෙළඳ ව්‍යාපාරයේ 2016 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 100000.00 |
| 2016.01.01 දිනට තොගය | 20000.00 | |
| ගැණුම් | 100000.00 | |
| විකුණුම් | | 185000.00 |
| ණයගැතියෝ | 35000.00 | |
| ණය හිමියෝ | | 40000.00 |
| 12% බැංකු ණය | | 100000.00 |
| ණය පොලි | 1000.00 | |
| යන්ත්‍ර (පිරිවැයට) | 250000.00 | |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් | | 25000.00 |
| රක්ෂණ ගාස්තු | 6000.00 | |
| ගෙවල් කුලි | 7500.00 | |
| බොල් ණය | 4000.00 | |
| දුන් වට්ටම් | 2750.00 | |
| බැංකු ගාස්තු | 500.00 | |
| ලී බඩු පිරිවැයට | 20000.00 | |
| අතැති මුදල් | 3250.00 | |
| | 450000.00 | 450000.00 |

අමතර තොරතුරු-

1. 2016.12.31 දිනට බඩු තොගය රු.16000.00කි.
2. ඉදිරියට ගෙවූ ගෙවල් කුලි රු.1000.00කි.

www.edudept.up.gov.lk

3. ගෙවිය යුතු රක්ෂණ ගාස්තු රු.1500.00කි.
4. යන්ත්‍ර 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

අ). 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු - 04)

ආ). 2016.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු - 04)

www.edudept.up.gov.lk